# සිංහල පාරිභාෂික වචන විකාරයක් ද?

සිංහල පාරිභාෂික වචන ගැන බොහෝ දෙනෙක්ගෙ තියෙන්නෙ ඒ තරම් සුබවාදී හැඟීමක් නෙවෙයි. විශේෂෙන් ම විද්‍යාව, තොරතුරු තාක්ෂණය හා වෙනත් තාක්ෂණික විෂයන් සම්බන්ධව. සමහරුන්ට මේක උහුලගන්න බැරි අපරාධයක්. සමහර වචනවල නුහුරු බව නිසා ඒ ගැන වැරදි වැටහීමක් ඇතිකරගත්ත අයත් නැතිව ම නොවෙයි. කොහොම වුණත් මේ රෝගය හැකි ඉක්මනින් සුව කළ යුතු යි. මේ ලිපිය ඒ වෙනුවෙනුයි.

හුගක් අය කියන දෙයක් තමයි විද්‍යා වචනවලට හදාපු සිංහල වචන නොතේරෙන බව. ඒ අය හුග දෙනෙක් හිතන්නේ ඉංග්‍රීසි වචනවලින් ඉගෙන ගන්නා අයට ඊට හොඳින් තේරුම් යන බවත් මේ ගැටලුව ඇත්තේ සිංහල පාරිභාෂික වචන නිසා බවත්.

පහත ඡේද උපුටා ගන්නේ විට්වෝටර්ස්රැන්ඩ් සරසවියේ විද්‍යා අධ්‍යාපනය පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරියක් වන *Samuel Ouma Oyoo* විසින් why language is so important in science මැයෙන් ලියූ ලිපියකින්. (තද කලු අකුරින් අවධාරණය මගෙන්):

> Science is considered a difficult school subject. This is partly because pupils find science words tough or unfamiliar. They are also confused when a word that means one thing in everyday language means something different in science. “Resistance”, for instance, means something totally different in everyday language and in physics.
>
> They will also be puzzled when a non-technical word seems to have acquired a meaning specific to the context of a particular science subject. “Disintegrate” when used in physics does not refer to something “breaking into lots of very small pieces”. **Even children who speak English as their first language and are learning science in English struggle because of these differences.**
>
> **A review of relevant research shows that students struggle with the language of the science classroom because of these differences whether they are learning in their home language or not. Boys and girls struggle equally. Pupils battle irrespective of their individual cultural backgrounds.**

විද්‍යාව සැලකෙන්නේ ඉගෙනීම තරමක් දුෂ්කර පාසල් විෂයයක් ලෙස ය. එයට ප්‍රධාන හේතුවක් වී ඇත්තේ විද්‍යා වචන බරසාර හෝ සමීප නොවන යෙදුම් ලෙස සිසුන්ට හැඟී යාම නිසා ය. එදිනෙදා කතාබහේ යෙදෙන වචනයක් විද්‍යා සන්දර්භය තුළ සම්පූර්ණ වෙනස් අරුතක් දනවන විට ද ඔවුහු ව්‍යාකුලත්වයට පත්වෙති. නිදසුනක් ලෙස Resistance යන වචනය එදිනෙදා වහරේත් විද්‍යා සන්දර්භයේත් දනවන්නේ එකිනෙකට මුලුමනින් ම වෙනස් වූ අරුත් දෙකකි.

තාක්ෂණික නොවන වචනයක් කිසියම් විද්‍යා විෂයයක සන්දර්භය තුළ දී නව අර්ථයක් වෙනුවෙන් යෙදවෙන විට ද ඔවුහු වියවුලට පත්වෙති.  භෞතික විද්‍යා විෂයය තුළ Disintegrate යන්න යෙදෙන්නේ යම් දෙයක් කුඩා කුඩා කැබලිවලට බිදී යාමක් හැඳින්වීමට නොවේ. **ඉංග්‍රීසි භාෂාව සිය මව් භාෂාව ලෙස භාවිත කරන සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගෙන ගන්නා සිසුන්ට පවා මේ වෙනස්කම් නිසා මේ වචන ඉගෙනීමේ දී යම් ආයාසයක් දැරීමට සිදු වේ.**

**මේ සම්බන්ධ අධ්‍යයනයන් පිළිබඳ ලියැවුණු විවරණයක් විසින් පෙන්වා දෙන පරිදි ඔවුන් සිය මව් බසින් ඉගෙන ගන්නේ ද, වෙනත් බසකින් ඉගෙන ගන්නේද  යන්න මත, මේ වෙනස්කම් නිසා විද්‍යා විෂයයේ භාෂාව සම්බන්ධයෙන් සිසුන්ට දැරීමට සිදුවන ආයාසයේ වෙනසක් සිදු නොවේ. පිරිමි ළමයි සහ ගැහැණු ළමයි එකසේ ගැටලුවට මුහුණ දෙති. තමන් අයත් සංස්කෘතික පසුබිම පිළිබඳ වෙනසකින් තොර ව සිසුහු ගැටලුවට මුහුණ දෙති.**

ඉගෙන ගන්නා භාෂා මාධ්‍යය පිළිබඳ භේදයකින් තොර ව විද්‍යා වචනවල අරුත් සිසුන්ට ගැටලුවක් වී ඇති බව මේ අනුව පැහැදිලි ඇති. ඒ කියන්නේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගෙනගන්නා වගේ ම ඉංග්‍රීසි මව්බස ම වන සිසුන්ටත් විද්‍යා වචන ගැටලුවක් වන බවයි. ඒ අනුව විද්‍යා වචනවල අරුත් නොතේරීම සිංහල පාරිභාෂිකවචනකරණය නිසා ම වන්නක් නොවන බව තේරුම් ගත යුතු යි.

හුගදෙනෙක් කියනවා තොරතුරු තාක්ෂණ විෂයේ පාරිභාෂික වචන කිසිම අර්ථවත් හැඟීමක් නොදෙන විකාර යෙදුම් බව. මේ ගැටලුවට විසදුමත් ඒ ලිපියේ ම ඇතුළත්. (තද කලු අකුරින් අවධාරණය මගෙන්)

This transformation of everyday words’ meanings when used in the science context is one reason that even learners who speak the language of learning and teaching fluently sometimes struggle to tell the meanings of everyday words when used in science.

Pupils will still have to be proficient in the language of learning and teaching. But **teachers will have to become more conscious of how words change their meaning in the context of a science classroom. Then they will need to carefully explain these words and their varied meanings.**

එදිනෙදා යෙදෙන වචනවලට විද්‍යා සන්දර්භය තුළ යෙදුණු විට සිදුවන මේ අර්ථ විපර්යාසය අධ්‍යාපන මාධ්‍යය ම සිය මව් බස වන ශිෂ්‍යයන්ට පවා මේ වචන විද්‍යා සන්දර්භ තුළ යෙදුණු විට මේ වචනවල අරුත් හඳුනා ගැනීමේ දී ඇතැම් විට දුෂ්කරතාවලට මුහුණ දීමට සිදුවීමට එක් හේතුවකි.

සිසුන් සිය අධ්‍යාපන මාධ්‍යය වන භාෂාව සම්බන්ධයෙන් නිපුණ වීම අනිවාර්ය ය. එහෙත් **ගුරුවරුන්ට විද්‍යා සන්දර්භය තුළ, වචන සිය අර්ථය පිළිබඳ වෙනස්කම්වලට ලක්වන ආකාරය පිළිබඳ ව වඩාත් අවදියෙන් සිටීමට සිදු වේ. අනතුරු ව ඔවුන් එම වචනවල අර්ථය සහ වෙනස්වන අර්ථ ද සැලකිල්ලෙන් යුතු ව සිසුන්ට පහදා දිය යුතු ය.**

එනම් ඒ පාරිභාෂික වචන තැනුණු අයුරු, ඒ යෙදුම්වල/ඒ යෙදුම් තැනීමට යොදාගත් යෙදුම්වල වෙනත් අරුත් ගැනත් දැනුවත් වීම යි. ගුරුවරුන් ඒ ගැනත් පංති කාමරයේ දී සාකච්ඡා කළ යුතු බව යි. නිසුනක් විදියට ආචයනය යන යෙදුම ගනිමු. ආචය යනු කෙලෙස් මනසේ තැන්පත් වීම යි. ඒ ඇසුරින් තැනූ ආචයනය යන කෘදන්තය පරිගණකයක් තුළ තොරතුරු ගබඩා කර තබාගැනීම යන අරුතට යොදන්න ගත්තේ අලුතින්. මේ යෙදුමට මුල්වුණු ඒ පැරණි යෙදුමේ අරුත නොදන්නා සිසුදරුවකුට මේ යෙදුම කිසිම අරුතක් දෙන්නේ නැහැ. එතනදි ගුරුවරයා මේ යෙදුම නිපන් හැටි, මේ පැරණි අරුත ගැන සිසුන්ට කියා දිය යුතු යි. සමහරුන් කුණුහරුප වගේය කියන සෙසු වචන ගැනත් කිව යුත්තේ මෙය ම යි.

සිංහල භාෂාවේ මූලික අක්ෂර වින්‍යාස, ව්‍යාකරණ පවා නොදන්න, සිංහල භාෂාව හැල්ලුවට ලක් කරන විද්‍යා, තොරතුරු තාක්ෂණ ගුරුවරුන් ඉන්න රටක මේ දේවල් සිදු නොවෙන බව ඇත්ත. නමුත් ඕස්ට්‍රේලියාවේ නම් විද්‍යා වචන නිර්මාණය වන හැටි සහ වචන නිපදවීමේ දී ඉංග්‍රීසි භාෂාවේ පදවල සිදුවන වෙනස්කම් ඉගැන්වෙන වෙන ම පාඩමක් තිබෙනවා. ඕස්ට්‍රේලියාවේ වික්ටෝරියා ප්‍රාන්ත අධ්‍යාපන අමාත්‍යාංශ වෙබ් අඩවියේ ඇති Introducing scientific language නම් ගුරු මාර්ගෝපදේශ ලිපිය ඇසුරු කළොත් ඒ බව පෙනේවි. එයින් මුලින් අප කී දෙයත් තහවුරු වෙනවා. ඒ තමයි සමහරු කියන විදියට විද්‍යා/තොරතුරු තාක්ෂණ විෂයන් ඉංග්‍රීසියෙන් ඉගැන්වුවත් සිංහල පාරිභාෂික වචනවලින් ඉගෙන ගැනීමට වඩා එය පහසුවක් නොවන බව. කොයි බසින් ඉගැන්වුවත් නිසි භාෂා දැනුම නැත්නම් විද්‍යාව ඉගෙන ගන්නා විට මේ ගැටලුව එන බව. මේ ගැටලුව සිංහලයේ පමණක් තිබෙන දෙයක් නම් ඕස්ට්‍රේලියාවේ පාසල්වල විද්‍යා වචන හැදෙන හැටි ගැන අර වැනි පාඩමක් උගන්වන්න වුවමනාවක් නැහැ.

දැනටමත් අපි යම් පමණකට සිංහල පාරිභාෂිකවචන විරෝධීන්ට පිළිතුරු දී අවසන් නමුත් මේ ගැන විවිධ අවස්ථාවල විවිධ අයගෙන් අසන්නට ලැබුණු කුතර්ක කීපයකටත් පිළිතුරු දීම යුතුකමක් කියා හිතනවා.

දවසක් තො. තා. පංතියක දී මගේ මිතුරෙක් මේ වචනවලට විරෝධය දක්වමින් කී කතාවක් මේ.

*මොකටද මේ වචන හදල? අපි පාවිච්චි කරනවද මවුස් එකට මූසිකය කියල?*

මේ තර්කය හරියට ම යෙදුවොත් මින් ඉදිරියට වෛද්‍යවරු ලියන රති උපදේශ ග්‍රන්ථවල සංසර්ගය වෙනුවට ____ කියාත් ශිෂ්ණය, යෝනිය, ශුක්‍ර තරලය යනාදියට ____ යනුවෙනුත් යෙදිය යුතු යි. මොකද පාවිච්චි කරන වචන ම භාවිතයට ගත යුතු නිසා. සාමාන්‍ය ජනතාවගේ භාවිතයත් විෂයක් ශාස්ත්‍රීය ව හදාරන අයගේ වාක්කෝෂයත් වෙනස්. ගම්වල මිනිස්සු ඇතැම් ලෙඩවලට කියන නම් නෙවෙයි වෛද්‍යවරු කියන්නෙ. තොරතුරු තාක්ෂණය වගේ ක්ෂේත්‍රවලදි අපි ඉංග්‍රීසි වචන ම කියන බව ඇත්ත. (සිංහල වචන ම කියන්න පුලුවන් නම් ඇත්තට ම අගෙයි.) හැබැයි සිංහලයේ කටවහර වගේ ම ලියන බසකුත් තියෙනවා. කටවහරට වඩා ශාස්ත්‍රීය පෙනුමක් තමයි ලියන බසේ තියෙන්නෙ. එතකොට ගෙදර දොරේ කියන වචන එතනට උචිත නෑ. (නමුත් මගේ පුද්ගලික මතය නම් ඇතැම් උපකරණ උදෙසා නම් අලුතින් නො තනා බසය, රේඩියෝව මෙන් ගත යුතු බව යි. ඇත්තට ම මවුස් යන්න මූසිකය ලෙස පරිවර්තනය කිරීම නො කළ යුතු දෙයක්. වොෂින් මැෂින් යන්න රෙදි සෝදන යන්ත්‍රය ලෙස පරිවර්තනය කිරීම නිවැරදියි. නමුත් මූසිකය යන යෙදුම එහි කාර්යබද්ධතාව හගවන යෙදුමක් නොව සංඥා නාමයකට සමාන කළ හැක්කක්. ඒ නිසා මගේ අදහස නම් මවුසය කියා ම යි එය ගත යුතු ව තිබුණේ. හැබැයි සිංහල වචන අතරෙ මූසිකය තියෙද්දි මවුසය කියා කියනවාට වඩා ගැලපෙනබවක් තියෙනවා.)

තවත් වතාවක පෞද්ගලික තො. තා. අධ්‍යාපන ආයතනයක උපදේශිකාවක් මේ ගැන කියූ අදහස් කීපයක් මේ.

*ඒක අයි. ටී. වල කන්සෙප්ට් එකක්නෙ .... ඇයි අපි ඒවට අලුතින් වචන හදන්නෙ .... ඒ තියෙන වචන ම පාවිච්චි කරා ම මොක ද?*

*අනිත් විෂයන් වගේ නෙවේ නෙ .... අයි. ටී. අලුතෙන්නෙ ආවෙ .... ඒවට වචන අපි ගාව නැනෙ .... එහෙම වචනයක් හැදුවම ඒකේ තේරුම වෙනස් වෙනවනෙ...*

තො. තා. විතරක් නෙවි ජීවවිද්‍යාව, වෛද්‍යවිද්‍යාව, භෞතිකවිද්‍යාව, රසායන විද්‍යාව වගේ විෂයනුත් බිහිවෙන්නෙ අලුතින් තමයි. ලෝකාරම්භයේ පටන් තිවුණු ඒව නෙවි. පටන් ගත්තු දවසේ අලුතින් තමයි පටන් ගත්තෙ. නමුත් ඒ විෂයන්වල සංකල්පවලට හදපු පාරිභාෂික වචන අද කොයිතරම් සාමාන්‍යයකරනය වෙලාද කියල උසස් පෙළ විද්‍යාව හදාරන කෙනකුගෙන් මේවල ඉංග්‍රීසි වචන අහල උත්තර නැතිවුණාම බලාගන්න පුලුවන්. ඒක ඇත්තටම හොඳ තත්වයක්. ලෝක දැනුම තමන්ගෙ භාෂාවෙන් කියන්න තමයි දැනගෙන ඉන්න ඕන.

සමහර විට ඇය අදහස් කරන්න ඇත්තෙ අනිකුත් විෂයන් පෙරදිගත් තිබුණු බව වෙන්න ඇති. ඒක නං ඇත්ත! නමුත් බටහිර වෛද්‍ය විද්‍යාව ගත්තොත් එහි එන සංකල්ප, රෝග, බොහොමයක් අලුතින් තමයි හොයාගන්නෙ. නැත්නම් පස්සෙ කාලෙක තමයි පෙරදිගට දැනකියාගන්න ලැබෙන්නෙ. නමුත් ඒවට සිංහල යෙදුම් බිහි නොකර ඇරල නෑ.

හරි. අපි තො. තා. අලුත් කියමුකො. එතකොට ඒ අලුතින් ආව තොරතුරු තාක්ෂණයේ සංකල්පවලට ඉංග්‍රීසි නම් හදන්නත් ඇත්තෙ අලුතින්. ඒ ඒ උපාංගවල ක්‍රියාකාරීත්වය හරි සංකල්පයෙන් අදහස් කෙරෙන දේ ගැන හරි හිතල ඒ දේ ඇගවෙන විදියට තමයි ඒ වචන හදල තියෙන්නෙ ඉංග්‍රීසියෙන්. Arithmetic and Logical Unit කියන්නෙ අලුතින් හදපු දෙයක්. ඒත් සංකල්පයවත්, නමවත් අලුතින්මද හැදුවේ? ඊට කලින් Arithmetic කියල දෙයක්, Logic කියල දෙයක් Unit කියල දෙයක් මිනිස්සු ගාව තිවුණ. වෙන විදියකින් කියනව නං කලින් තීන සංකල්ප එකතුවෙලයි අලුත් සංකල්ප හැදෙන්නේ. එතකොට Arithmetic and Logical Unit කියන දේ සුද්දගෙ සංකල්පයක් වුණාට, ඉංග්‍රීසි වචනයක් වුණාට ඒකට මුල්වෙච්ච අර මූලික සංකල්ප තීන ඕන ම භාෂාවකට ඒ සංකල්පයට තමන්ගෙ වචනයක් ඒ අර්ථයම දෙන්න හදන්න පුලුවන්. අංක ගණිතමය හා තාර්කික ඒකකය කියන යෙදුම තුළ මුල් සංකල්පයේ අර්ථය, හෝ විෂයමය හැගවුම අඩුවෙලා හරි ගිලිහිලා හරි තියෙනවද?

ඉංග්‍රීසියේ විද්‍යා වචනවලින් සෑහෙන ප්‍රමාණයකුත් ග්‍රීක ධාතු සහ ප්‍රත්‍ය/උපසර්ග එක්කර ගනිමින් සාදා ගැණුනු ඒවා.

> Many scientific words are logically built up from simpler word-elements (usually of Greek or Latin origin) and the general meaning of the whole can be inferred from an understanding of the parts.
>
> In his task of inventing new terms, however, the scientist has usually turned to the classical languages for his raw material. He has taken 'bits and pieces' - roots, prefixes, suffixes - from these languages and joined them together to form the terms he needed. Thus, when he needed a general name for animals such as snails and slugs which apparently walk on their stomachs, he took the Greek roots *gast(e)ro-* (stomach) and *-pod* (foot) and formed the new word *gastropod.* When he wanted a word to describe a speed greater than that of sound he took the Latin prefix *super-* (above, beyond) and the Latin root *son-* (sound) and coined the adjective *supersonic.* Thousands of scientific words have been built up from classical word-elements in this way.

- උපුටාගැනීම W. E. Flood, *Scientific words: Their structure and*

*meaning*, Oldbourne, 1960

> බොහොමයක් විද්‍යා යෙදුම් (ග්‍රීක සහ ලතින් භාෂාවල) සරල වාක් ඒකක තාර්කික ව සම්බන්ධ කිරීමෙන් නිපද වී ඇති අතර එම කොටස්වල අරුත් පහදා ගැනීමෙන් යෙදුමේ ම සමස්ත අරුත අපෝහනය කළ හැකි ය.
>
> නව යෙදුම් බිහිකිරීමේ සිය කාර්යයේ දී විද්‍යාඥයා සිය අමුද්‍රව්‍ය සපයා ගැනීමට යොමු වූයේ සම්භාව්‍ය භාෂාවන් කෙරෙහි ය. ඔහු කුඩා කොටස් - ධාතු, උපසර්ග, ප්‍රත්‍යය - මෙම භාෂාවලින් ලබාගත් අතර ඒවා සංයෝග කරමින් තමාට ඇවැසි යෙදුම් නිමවා ගත්තේ ය. මෙලෙස, ඔහුට ගොලුබෙල්ලන්, හම්බෙල්ලන් වැනි සිය උදරය පාදයක් ලෙස සකස් වී ඇති බවක් පෙනෙන සතුන් සඳහා පොදු වචනයක් අවශ්‍ය වූ කල්හි ඔහු උදරය යන අරුත දෙන ග්‍රීක ධාතුව වන *gast(e)ro* යන්නත් පාදය යන අරුත දෙන *-pod* යන්නත් රැගෙන *gastropod* යන නව යෙදුම සෑදුවේ ය. ඔහුට ශබ්දයේ වේගයට වඩා වැඩි වේගය හැඳින්වීමට වචනයක් අවශ්‍ය වූ විට ඔහු ඉහළ/වැඩි යන අරුත දෙන *super-* යන ලතින් උපසර්ගයත් ශබ්දය යන අරුත දෙන *son-* යන ලතින් ධාතුවත් ගෙන *supersonic* යන විශේෂණය නිර්මාණය කළේ ය. මේ ආකාරයෙන් සම්භාව්‍ය භාෂාවල පදාංග යොදාගනිමින් විද්‍යා යෙදුම් දහස් ගණන් නිර්මාණය වී ඇත්තේ ය.

ඉංග්‍රීසියේ පාරිභාෂිකවචනකරණයත් සිංහලයේ සිදුවන ක්‍රියාවලියට ම සමාන එකක් බව ඉහත විග්‍රහයෙන් පැහැදිලි ඇති. ග්‍රීක, ලතින් වෙනුවට අප පාලි, සංස්කෘත යොදාගැනීම පමණයි වෙනසක් විය හැක්කේ.

සිංහල භාෂාවෙන් නූතන විද්‍යා විෂයන් ප්‍රකාශ කරන්න බැරි බවත් සමහරු අදහන මිත්‍යාවක්. අද නම් මේ මතය දරන්න තරම් මෝඩ අය නැතිව ඇති. මොකද අද සිංහල භාෂාව විද්‍යා විෂයන් ප්‍රකාශ කරන්න මැනවින් යොදාගෙන තිබෙන නිසා. නමුත් සිංහල භාෂාව පාරම්පරික දැනුම පමණක් ප්‍රකාශ කරන්න පුලුවන් පමණින් තිබුණ, නූතන විෂයන් ප්‍රකාශනයට හැඩගැසෙමින් තිබුණ යුගයේ සිංහලය අධ්‍යාපන මාධ්‍යය වීමට අකමැති වුණු උදවිය මේ තර්කය යොදා ගනිපු බව මාර්ටින් වික්‍රමසිංහ 'බණ කථා සාහිත්‍ය' නම් පොතේ ඒ තර්කය බිඳ හෙළමින් ලියූ ලිපියකින් පේනවා. එහි වික්‍රමසිංහ ඇමරිකන් වාග්/මානව විද්‍යාඥ දෙපලකගේ පොතකින් ගෙනහැර දක්වන ඡේදයකට අනුව රතුඉන්දියන් හෝ ඇමසන් ගෝත්‍රික භාෂාවක් වුවත් අද ඉංග්‍රීසිය පවත්නා තත්ත්වයට දියුණු කළ හැකියි. අවාසනාවකට වික්‍රමසිංහ ඒ පොතවත් ලේඛකයන්වත් සඳහන් කර නැහැ. නමුත් කොලොම්බියා විශ්වවිද්‍යාලයේ සහකාර මහාචාර්යවරියක වන කැරොල් බෙන්සන් [The importance of mother tongue-based schooling for educational quality] මැයෙන් 2004 දී ලියූ වාර්තාවකත් උක්ත අදහස ම මට හමුවුණා.

> **The myth that local languages cannot express modern concepts. Another colonial concept is the supposed inherent worth of European**

**languages in contrast to others, but all human languages are equally able to express their speakers' thoughts and can develop new terms and structures as needed. Cheikh Anta Diop once illustrated this by translating Einstein's Theory of Relativity into Wolof, a lingua franca of Senegal. The difference lies in which languages have historically been chosen for "intellectualization," or development, through writing and publishing (Alexander 2003).**

නවීන සංකල්ප ප්‍රකාශ කිරීමට දේශීය භාෂාවන්ට නො හැකි ය යන මිථ්‍යාව: අන් භාෂාවලට ළගාකරගත නොහැකි වටිනාකමක් යුරෝපීය භාෂාවල ඇති බව ද තවත් එක් යටත්විජිතවාදී මතවාදයකි. නමුත් සෑම මානව භාෂාවක් ම එකී භාෂක සමාජයන්හි අදහස් ප්‍රකාශ කිරීමටත් ඇවැසි පරිදි නව යෙදුම් සහ ව්‍යුහ නිපදවා ගැනීමටත් එක සේ සමත් ය. සෙනගාලයේ පොදු වහරක් වන වොලොෆ් බසට අයින්ස්ටයින්ගේ සාපේක්ෂතාවාදය පිළිබඳ සංකල්ප පරිවර්තනය කරමින් චෙයික් අන්ටා ඩියොප් වරක් මේ බව පෙන්වාදෙන ලදී. වෙනස නිර්ණය වන්නේ ඓතිහාසික වශයෙන් භාෂාවක් ඥානවත්කිරීමට, එනම් ලිවීම සහ ප්‍රකාශනය තුළින් සංවර්ධනයට බඳුන් වී ඇත් ද යන්න මත ය. (ඇලෙක්සැන්ඩර් 2003).

බ්‍රිතාන්‍යයේ පෝට්ස්මවුත් විශ්වවිද්‍යාලයේ භාෂාව සහ දේශපාලනය පිළිබඳ සම්මානිත මහාචාර්ය සූ රයිට් ද පවසන්නේ මෙවැනි දෙයක්;

We should reject a very common argument that languages have intrinsic qualities that make them particularly suited to be the language of science, philosophy and so on, This is nonsensical. The qualities that are cited, for example, large and expressive vocabularies, come because the language is used in a wide variety of domains by a large number of speakers. Any language used extensively in these domains would eventually acquire the same vocabulary and range.

උපුටා ගැනීම - Sue Wright, Language Policy and Language Planning, පි. 138

යම් යම් භාෂාවන් විද්‍යාවේ භාෂාව, දර්ශනයේ භාෂාව ආදි ලෙස විවිධ ක්ෂේත්‍රයන්හි භාෂාව බවට පත්වීමට සුදුසු වන පරිදි නිසර්ගයෙන් උරුම කරගත් ගුණයන් භාෂාවන් සතු වන බවට නිතර නිතර ඉදිරිපත් වන තර්කය අපි ප්‍රතික්ෂේප කළ යුතු වෙමු. මෙය විකාර අදහසකි. මෙසේ දක්වනු ලබන ලක්ෂණ, නිදසුන් ලෙස

> දැවැන්ත සහ ඉහළ ප්‍රකාශනාත්මක බවින් යුතු වාක්කෝෂ බිහිවී ඇත්තේ එකී භාෂාව විශාල පරාසයක දැනුම් ප්‍රකාශනයට විශාල ප්‍රජාවක් විසින් යොදාගෙන තිබීම නිසා ය. එම ක්ෂේත්‍රයන්හි ම පුළුල් ව භාවිත කෙරෙන ඕනෑම භාෂාවක් ඉක්බිතිව ම එකී වාක්කෝෂය සහ දැනුම් පරාසය අත්කරගනු ඇත.

සිංහල භාෂාවත් ඉංග්‍රීසි, ප්‍රංශ භාෂා මෙන් ම ඉතා ඈත කාලයේ පටන් ලේඛනයට, ගැඹුරු අදහස් ප්‍රකාශනයට යොදාගැනීම තුළින් සංවර්ධනයට ලක් කෙරුණු බසක්. බුදුදහම විවරණය කෙරෙමින් ලියැවුණු හෙල අටුවා එයට නිදසුනක්. බුදුදහම වැනි ගැඹුරු දහමක වාහකය වීම නිසා සිංහල භාෂාවත් එහි වාක්කෝෂයත් පුලුල් වුණා. යටත්විජිත බලපෑම් මත නූතන අදහස්වල මුණගැසීමත් එම අදහස් ප්‍රකාශනයට යොදා ගැනීමත් නිසා 19 සහ 20 සියවසේ මැද තෙක් කාලය තුළ එය තවත් සංවර්ධනයට ලක්වුණා. ඒ අනුව පරිවර්තනය, රජය, දෙපාර්තමේන්තුව, ආයතනය, මහේස්ත්‍රාත් ආදි නව යෙදුම් හෝ නව අරුත්හි යෙදවූ පැරණි යෙදුම් එයට එක්වුණා. බටහිර නීති, දේශපාලන සංකල්ප ප්‍රකාශනයට සුදුසු පරිදි හැඩගැසුණා.

බ්‍රිටනිකා විශ්වකෝෂය ඉංග්‍රීසි භාෂාව ගැන ලිපියේ සඳහන් කරන පරිදි ඉංග්‍රීසි භාෂාවේ වාක්කෝෂයෙනුත් සැහෙන වචන ප්‍රමාණයක් වෙනත් භාෂාවලින් (කාලක් ජර්මානුක භාෂාවලිනුත්, තුනෙන් දෙකක් රොමැන්සීය භාෂාවලිනුත්) ගත් ඒවා බවයි. විශේෂයෙන් ම දේශපාලනය, නීතිය සම්බන්ධයෙන් ප්‍රංශ භාෂාවේ යෙදුම්වලට ඉංග්‍රීසිය සැහෙන්න ණය බවයි.

ඒ වගේ ම මෙලෙස විද්‍යා වචන නිර්මාණයට ඇවැසි වන්නේ ඉතා සුලු මූලවචන ප්‍රමාණයක්. මූලවචන අතලොස්සක් වෙනස්කම්වලට ලක්කරමින් හෝ සංයෝග කරමින් තමයි ඉංග්‍රීසියේ නවීන විද්‍යා පාරිභාෂික වචන බිහි වී තිබෙන්නෙත්. නිදසුන් විදියට වෛද්‍ය විද්‍යාවේ කායව්‍යවච්ඡේද විද්‍යාවේ එවක වචනවලින් බහුතරයක් වූ 30 000 ක් ම නිම වී ඇත්තේ මූලවචන 150 ක් වැනි සුලු ප්‍රමාණයක් සහ සිරුරේ අවයව අනුසාරයෙන් පමණක් බව පහත උධෘතයෙන් පෙනේවි.

> Despite the enormous size of the modern vocabulary of science, the basic elements from which the words have been constructed are comparatively few. …A large proportion of the words have been built up from a much smaller number of elements. (The greater part of the vocabulary of medicine and anatomy - perhaps 30,000 words - has been constructed by the use of only about 150 standard word-elements and the names of the parts of the body.)
>
> - උපුටාගැනීම W. E. Flood, *Scientific words: Their structure and meaning*, Oldbourne, 1960

ඉතින් එහෙම නම් කලින් දැක්වූ පරිදි සිංහල භාෂාව ශාස්ත්‍රීය කරුණු අරබයා දියුණු දීර්ඝකාලීන ලිඛිත සාහිත්‍යයක් තිබෙන භාෂාවක් වශයෙන් මේ මූලික සංකල්පවලින් ඕනෑවටත් වඩා පොහොසත් නිසා නවීන විද්‍යා පාරිභාෂික වචන තනාගැනීම සම්බන්ධයෙන් ඉංග්‍රීසිය සමග කරට කර සිටින්නට සිංහලයට හැකියි.

මම හිතන්නෙ ඇගේ විරෝධතා කීපයකට ම මේ නිදසුනෙන් පිළිතුරු ලබාගන්න පුලුවන්. ඒ නමුත් මේ හේතුවට දෙන්න පුලුවන් තව පිළිතුරු බොහොමයක් අපි ගාව තියෙනව.

තොරතුරු තාක්ෂණයේ තියෙන සංකල්ප අපි ළග නැති නිසා වචන හැදීම නොයුතු බවත් ඒ සංකල්ප අප වැනි බසකට ගන්න බැරි බවත් කියන අය මීට වඩා ගැඹුරු, බටහිර සංස්කෘතියට ආගන්තුක බුදුදහමේ සංකල්පවලට ඉංග්‍රීසි යෙදුම් තනා තිබීම ගැන මොකද කියන්නෙ? ඉංග්‍රීසිය වැනි පෙරදිග ආධ්‍යාත්මික සංකල්පවලට ඉතා දුරස් බසකටත් ඒ සංකල්පවලට යෙදුම් තනාගන්න හැකි වුණා නම් තාක්ෂණය වගේ ලෞකික දේවල් උදෙසා වූ වදන් අපිට හදාගන්න බැරිවෙන්නෙ ඇයි? දැවැන්ත සංකල්පීය වෙනසක් තිබෙන සිතින් මවාගන්නත් අපහසු බෞද්ධ දාර්ශනික සංකල්ප ඉංග්‍රීසියෙන් කියන්න පුලුවන් නම් ඇහැට කනට පේන සාමාන්‍ය යන්ත්‍ර සූත්‍රවලටත් ඒවයෙ ක්‍රියාකාරීත්වයට සම්බන්ධ සංකල්පවලටත් සිංහලෙන් යෙදුම් හදන්න බැරි ඇයි?

නිදසුනක් ගනිමු. බුදුදහමේ දුක යන්නට ඇතැම්විට යෙදෙන suffer කියන ඉංග්‍රීසි යෙදුමෙ අරුත වේදනාකාරී, අප්‍රසන්න අත්දැකීමක් ලැබීම යි. නමුත් බුදුදහමේ දුක කියන්නේ දුක් සහිත අත්දැකීම් ම නෙවි. මේ පරිවර්තන දෝෂය නිසා අනන්ත සුද්දෝ අහනවා දුක විතරක් නෙවිනේ ලෝකේ සැප දේවල් කොච්චර තියෙනව ද? කියලා. ඒත් මේ සිංහල පාරිභාෂික වචනවල දොස් දකින අය කවදාවත් කියනවාද මේ නිසා බුදුදහම ඉංග්‍රීසියට පරිවර්තනය නොකළ යුතුයි කියා? මේ වචන භාවිත නොකළ යුතු යි කියා? නැහැ. ඔවුන් අකමැති බටහිර ලෝක දැනුම අපේ සාමාන්‍ය ජනතාවට තේරුම් ගත හැකිවන පරිදි කියනවාට විතරයි. බුදුදහම ඉංග්‍රීසියෙන් කියනවිටත් සිංහල පාරිභාෂික වචනවලින් අපිට ඇතැම් අරුත් හරිහැටි නොලැබෙනවා කියන මේ කියන ගැහැට ම සුද්දට වෙන බව දැන් පැහැදිලි ඇති.

මම මේකෙන් අදහස් කරන්නෙ නැහැ බුදුදහම ඉංග්‍රීසියෙන් කීම හෝ මේ වචන යොදාගැනීම වැරදියි කියා. මම කියන්නෙ එය එසේ විය යුතු ය කියලයි. මොකද එක සංස්කෘතියක දැනුම අනෙක් සංස්කෘතීන් වලටත් ගමන් කළ යුතුයි. කවර සංස්කෘතියක් වුණත් යමක් ඥානනය කරන්නේ (සිතන්නේ) භාෂාව ඇසුරින්. ඒ නිසා සංස්කෘතියක් තවත් සංස්කෘතියක නිපදවුණු දැනුම ලබාගැනීමේ දී ඒ සංකල්පවල අර්ථය හැගවෙන නව යෙදුම් බිහිවීම විය යුතු ම දෙයක්. නව යෙදුම් තැනීමට අමතරව වෙනත් සන්දර්භයක දී විෂයේ සංකල්පයට සමාන/එවැනි ම අරුතක් දනවන පැරණි සිංහල යෙදුම් නව විෂයමය අර්ථය සඳහා භාවිතා කිරීමත් සිදුවෙනවා. නිදසුන්: ඉන්ස්ටෝල් = ස්ථාපනය. ස්ථාපනය කියන්නේ යමක් පිහිටුවනවා කියන අරුත. එය මෘදුකාංගයක් පරිගණකයක පිහිටුවීමට යොදන්න ගත්තේ අලුතින්. ඒ කියන්නේ එය අලුත් අරුතක යෙදවුණා. ඉංග්‍රීසි install

කියන යෙදුමට ඔක්ස්ෆර්ඩ් කොන්සයිස් ශබ්දකෝෂය දෙන අරුත දෙස බලන විට පැහැදිලි වවන්නේ මුල් ඉංග්‍රීසි යෙදුමත් තො. තා. ට ම අනන්‍ය වූවක් නොවන බව යි. නව යෙදුම් නො තනා මුල් වචනය ම භාවිතා කරන තැනුත් තිබෙනවා. නිදසුන් විදියට බටහිර වෛද්‍ය විද්‍යාවේ සමහර රෝග, ග්‍රන්ථි, හෝමෝන වගේ දේවලට නම් හදන්නේ නැහැ. රසායන විද්‍යාවේ මූලද්‍රව්‍ය හෝ එහෙමත් නැත්නම් වෙනත් විද්‍යාවල භාවිත වෙන උපකරණවලට අලුත් නම් හදන්නේ නැහැ. මොකද ඒව සංඥා නාම මිසක් මුල් භාෂාවේ අරුතක් ඇති යෙදුම් නෙවි. නමුත් කිසියම් විද්‍යා යෙදුමක අරුතක් තියෙනකොට ඒ අරුත නොකියා විදෙස් බසකින් කීම යුතු නැහැ. එනිසා විෂයේ සංකල්පීය යෙදුම් පමණක් පරිවර්තනය කරනවා. ඒ වගේම මුල් යෙදුම අපේ බසට ගැලපෙන හැඩරුවකින් යොදාගැනීමත් සිදුවෙනවා. (ඇල්ගොරිතමය, සැසිය/සැසි ස්ථරය,දත්ත, අරාව) යෙදුම සිංහලට ගැනීමේ දී සුදුසු ක්‍රමය අනුගමනය නොකළොත් ගැටලු ඇතිවෙන්නෙ පුලුවන්. හැබැයි පාරිභාෂිකවචනකරණයේ දුර්වලතාවක් සිදු වූ පමණින් ක්‍රියාවලියට දොස් කීම වැරදියි. හදපු මිනිහයි වැරදි යෙදුමයි විතරක් බැනුම් ඇහුවම ඇති.

නිදසුනක් ගනිමු. අපි සමහර නව තාක්ෂණික යෙදුම්වලට පාරිභාෂික වචන තැනීමේ දී නව සංකල්පයට සමාන අරුත් දෙන පැරණි යෙදුම් භාවිතා කරනවා. මේ පැරණි යෙදුම් අලුත් අර්ථෙකින් භාවිතා කළාට ඒවා එක්ක බැදිල තියෙන සාම්ප්‍රදායික හැගවුම ඉවත් වෙන්නේ නැහැ. තො. තා. වල Entity Relationship Diagram වලට සිංහලෙන් භූතාර්ථ සම්බන්ධතා සටහන කීවම හිනහ යන්නේ ඒකයි. භූතාර්ථය (වූවක්, වූවෙක් යන අර්ථය[1]) කියන්නේ එන්ටිටි කියලා ඉංග්‍රීසියෙන් කියන දේ ම තමයි. ඒත් අපිට වෙන වෙන භූතයෝ මතක් වෙන එක වළක්වන්න බැහැ. ඒකට කරන්න ඕන නිරුක්තිමය විදිහට ම බලන්නේ නැතුව වචනය ඇහුවම දැනෙන විදියත් සැලකිල්ලට ගන්න එක. සහභාගීත්ව සබඳතාවය කියල තේරෙන සිංහලෙන් ඕකට කියන්න තිබුණ. පණ්ඩිතයෝ එකතු වෙලා වචන හැදුවම ඔහොම තමයි. ගූගල් හා ජීමේල් සිංහල අතුරුමුහුණත් ෆේස්බුක් සිංහල අතුරුමුහුණත සමග සසදලා බලන්න පුලුවන් පණ්ඩිතයන්ගේ වචන හැදිල්ලෙයි සාමාන්‍ය අයගේ වචන හැදිල්ලෙයි වෙනස බලාගන්න. ෆේස්බුක් සිංහල අතුරුමුහුණත හැදුවේ සාමාන්‍ය මිනිස්සු යෝජනා කරපු නම්වලින්. ඒ නිසා ඒක සරලයි. සිංහල විකිපීඩියා අතුරුමුහුණත ඊටත් වඩා එහයින් ඉන්නවා. ඒත් ජීමේල් අතුරුමුහණතේ සමහර තැන්වල සිංහල අපිට තේරෙන්නේ නැහැ. ලෝඩිං කියන එකට *මොහොතක් ඉන්න/කාලය ගතවෙමින්/ප්‍රවේශ වෙමින්* නොකියා *පූරනය වෙමින්* කියනවා. ඉංග්‍රීසි ලෝඩ් කියන වචනයේ හෝ තාක්ෂණික සංකල්පයේ අරුත එලෙසින් ම පරිවර්තනය කරන්න නොයා මිනිස්සුන්ගේ ඔලුවට අදහස යවන්න වචන හදනවනං හොඳයි. සකුබර හැදුණු පණ්ඩිතයන් තේරෙන සිංහලෙන් - ගැම්බසින් - මුදුකෑම නොකියා සංස්කෘතයට බර වෙමින් සමුද්‍ර බාදනය වැනි නුහුරු යෙදුම් තැනූ බවට වික්‍රමසිංහ (ව්‍යවහාර භාෂාව හා පරිණාම ධර්මය – සංඥාපණය) දොස් නැගුවා.

වතාවක් මගේ සගයෙක් විද්‍යාව තුළ එන සිංහල පාරිභාෂික යෙදුම් ගැන අදහස් දක්වමින් කිව්වෙ ඇතැම්විට, දැනෙන හැඟීම වෙනස් වන බවයි. ඩොප්ලර් ආවරණය කීවාට වඩා ඩොප්ලර් ඉෆෙක්ට් කීවාම ඔලුවට අදහසක් එන බවයි ඔහු කිව්වෙ. ආවරණය කියන්නේ බලපෑම කියන අර්ථය. ඩොප්ලර් ආවරණය කියන්නේ ධවනි ප්‍රභවයක්, නිරීක්ෂකයකුට

[1] සරසවි සිංහල-සිංහල ශබ්දකෝෂය, 936 පිටුව

සාපේක්ෂ ව චලිතයක යෙදෙන විට තරංගයේ සංඛ්‍යාතය වෙනස් වීමේ සංසිද්ධිය. ආවරණය[2] (1. හැසිරීම/කිරීම/පුරුදු කිරීම/පැවැත්ම/පිළිපැදීම 2. ඵලය/ප්‍රතිවිපාකය) කියන අර්ථය සංසිද්ධිය[3] (ඉෂ්ට වීම/සඵල වීම/සිදුවීම/ඉපදවීම/ඉඳුරන්ට කෙළින්ම ගෝචර වූවක්/නිරීක්ෂා කළ හැකි සිදුවීමක්) කියන අර්ථයට වඩා ඉෆෙක්ට් කියන වචනය වෙනුවට සහ මෙවැනි සංකල්පයකට වඩාත් සුදුසු බව වැටහෙන්නේ මේ වචනවල තේරුම් දැනගත්තාම මිසක් විද්‍යාව ඉගෙන ගත්තු පළියට නෙවි. අපි මව්-භාෂාවෙන් ඈත්වුණු පරම්පරාවක් නිසා අපිට අපේ ම භාෂාවේ යෙදුම් නුහුරු යි. හරියට ළමාවියේ ම අරන් හදාගත්තු දරුවකුට හැබෑ මව දැක්ක ම කවුදෝ නාඳුනන ගැනියෙක් වෙනවා වගේ අපිටත් අපේ ම වචන අමුතු වෙලා. නමුත් එහෙම දරුවෙක් අරන් හදාගත්ත ම සාමාන්‍යයෙන් වෙන්නේ නැවත සැබෑ මව සොයාගෙන පැමිණීමයි. අපිත් වෙන්න ඕන එහෙමයි. එදා මාර්ටින් වික්‍රමසිංහල ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගෙනගත්තට ඔවුන් පන්සල ඇසුරේ පාලි සංස්කෘත භාෂාවනුත් ප්‍රගුණ කළා.

වීජගණිතයේ සිද්ධාන්ත මුලින්ම ඉදිරිපත් කළේ අරාබි ගණිතඥයෙක් වුණු අල් ක්වාරිස්මි. ඔහු ඒ ගැන ලියූ Ilm al-jabr wa'l-mukābala නම් පොතේ නම ඇසුරින් තමයි ඇල්ජිබ්‍රා කියන යෙදුම පවා තැණුනෙ. (අල් ජබ්ර් කියන එකේ තේරුම *බිඳුණු විසුරුණු කොටස් එක්කිරීම*) පසුව තමයි වීජගණිතය බටහිර ගණිතඥයන් දියුණු කරන්නෙ. ඔවුන් ඒ ගැන මුලින් ම දැනගන්නෙත් ක්වාරිස්මිගෙ පොතෙන්. ක්වාරිස්මි දැනගත්තෙ හින්දුවරුන්ගෙන්! සිංහල, ඉංග්‍රීසි නං එකම පවුලෙ භාෂා. නමුත් අරාබි කියන්නෙ ඉංග්‍රීසිත් එක්ක ගත්තාම සැහෙන වෙනස් භාෂාවක්. අපි සිංහල වචන හදනකොට ඒ විෂයන්වල සංකල්පවලට වෙන පාඩුව ක්වාරිස්මි අරාබියෙන් කියපු වීජගණිත සංකල්ප ඉංග්‍රීසියට හරවගන්නකොට උනේ නැත්තෙ ඇයි කියල තො. තා. අපේ නොවන විෂයක් නිසා අපි වචන නොහැදිය යුතු ය කියන මේ අය මට කියාදෙන්න ඕන. ඒ වගෙමයි අරව අරාබි භාෂාවෙන් කියපු දැනුමක්, ඒවට සංකල්ප අපි ළඟ නෑ කියල එදා බටහිර ගණිතඥයො හිටිය නම් මේ අයට අදටත් වීජගණිතය ඉගෙනගනිද්දි අරාබි වචන ඉගෙනගන්න වෙනවා. මේ කියන විදියට පාරිභාෂික වචන හදන්න බැරි නම් ඇයි ඉංග්‍රීසියෙන් වීජගණිතය ඉගෙන ගනිද්දි අරාබි වචන එකක්වත් අහන්න නොලැබෙන්නෙ?

යම් විෂයක්, සංකල්පයක් කොයි සංස්කෘතියක් තුළ කොයි භාෂාවක් ඇසුරේ ගොඩනැගුණත් ඒව අවසානයේ මුලු මිනිස් වර්ගයාගේ ම ඥානය. එය පොදුවේ ලෝක උරුමයක්. ඒ නිසා අපේ නොවන විෂයන් කියා දෙයක් නැහැ. අප සතුව සංකල්ප නැති නිසා යම් දැනුමක් අපේ බසින් නොකිව යුතු යි කියා කියන්නේ සංස්කෘතීන් අතර දැනුම් හුවමාරුවට අකමැති අමු ගෝත්‍රවාදීන්. යම් දැනුමක් ලෝක ව්‍යාප්ත වූවා කියා එය සොයාගත් අයට සතුටු විය හැක්කේත් එය ලෝකයේ හැම බසකින් ම ප්‍රකාශ වන විට තමයි. ඒ නිසා පාරිභාෂික වචන නිර්මාණය ඉංග්‍රීසි බැරි (මේ ලියන මම වගේ) ගොඩයන්ගේ හිතසුව පිණිස කරන අනාථාධාර වැඩපිළිවෙළක් වගේ දේකුත් නෙවෙයි.

---

[2] සරසවි සිංහල-සිංහල ශබ්දකෝෂය, 116 පිටුව

[3] සරසවි සිංහල-සිංහල ශබ්දකෝෂය, 1282 පිටුව

*මේව උගන්නන්න ඕන ඉංග්‍රීසියෙන්නේ... සිංහලෙන් උගන්නලා කොහොමද ලෝකෙට යන්නෙ* - තො. තා. ගුරුවරයෙක්

මේ ගැටලුවට කළ යුත්තේ සිය බසින් උගෙන ගන්නා අතර ම ඉංග්‍රීසි පාරිභාෂික වචනත් උගෙනීමට සැලැස්වීමයි. මේවා පාඩමත් සමග මුද්‍රණය කර බෙදාදෙන්නට/පොතේ පාඩමක අගට යොදන්නට පුලුවන්. 10 ශ්‍රේණිය නව භූගෝල විද්‍යා පෙළපොතේ මෙය කර තිබෙනවා. අමතර ව අදාල විෂය/මාතෘකාව යටතේ අන්තර්ජාලයෙන් කරුණු සොයාගෙන පැවරුම් කිරීමටත් ඔවුන් ව යොමු කරවන්න පුලුවන්. එවිට ඔවුන්ට ඒ වචන භාවිතා වෙනවා. මෙවැනි ක්‍රියාකාරකම්වලට දෙන ලකුණු විභාග සමත්වීමටත් බලපාන ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළා ම ඔවුන්ට විෂය සම්බන්ධ ඉංග්‍රීසි පත-පොත පරිශීලනය අනිවාර්ය වෙනවා. නමුත් ඒ පැවරුම් පවා ඔවුන් කළ යුතු විය යුත්තේ සිංහලෙන්. ඉංග්‍රීසියෙන් කියවා, උගත් පාරිභාෂික වචන අනුසාරයෙන් සොයාගත් විෂය කරුණු සිංහලෙන් කීමට ඔවුන් පෙළඹවිය යුතු යි.

ලිනක්ස් මින්ට් අත්පොතක් ලියන එස්. වන්නි ආච්චිගේ අවවාද කරන්නේ සිංහල අතුරුමුහුණත් කිසිවිටෙක යොදානොගන්නා ලෙසටත්, එය දාගත්තොත් නම් අමාරුවේ වැටෙන බවටත්. ඔහු හේතුව ලෙස දක්වන්නේ ඇතැම් සිංහල වචන කුණුහරුප වගේ බවයි. ඔහු උපහාසයෙන් කියනවා - *ඩවුන්ලෝඩ් කියන එකට හදලා තියෙන්නේ බාගත කරනවා කියලා* කියා. ඔව් ඩවුන්ලෝඩ් යන්නට බාගැනීම කියාත් අප්ලෝඩ් යන්නට උඩුගත කරනවා කියාත් භාවිත වෙනවා තමා. බාගන්නවා කියන්නේ පහළට ගන්නවා/පාත් කරගන්නවා කියන අර්ථය තමයි. ඩවුන්ලෝඩ් කියන්නේ එවැනි ක්‍රියාවක් තමා. (මලලසේකර ශබ්දකෝෂයේ නම් තියෙන්නේ අවපතනය කියලා)

වතාවක් උසස් පෙළ භූගෝල විද්‍යා ගුරුවරයෙකුත් කීවේ ජංගම දුරකථනවල සිංහල අතුරුමුහුණත් ඉංග්‍රීසි අතුරුමුහුණත් තරම් නොතේරෙන බවයි. මේක වෙන්න පුලුවන් දෙයක් ද? උපන්දා පටන් කථා කළ බස නොතේරී වෙන බසක් තෙරෙන එක? ඉංග්‍රීසි අතුරුමුහුණතට වුණත් අපි මුලින් ම හුරු වුණේ තැත්-වරද ක්‍රමයට/අත්දැකීමෙන් මිසක් තේරුම දැනගෙන නෙවෙයි. ඒ නිසා සිංහල අතුරුමුහුණතේ වචන තේරෙන්න අවශ්‍ය නැහැ එය පාවිච්චි කරන්න. පුංචි ම පුංචි දරුවන් අධිපහසුකම් දුරකතන (smart phone: අපිට උසස් පෙළ දී නම් මේවට කිව්වේ බුහුටි දුරකතන කියලා. නමුත් මා යොදපු යෙදුම ඊට වඩා නිවැරදියි කියා හිතෙනවා. නැතිනම් ස්මාට් දුරකතන කිව හැකියි.) පාවිච්චි කරන්නේ ඉංග්‍රීසි වචනවල තේරුම් දැනගෙන ද? අපිට සිංහල අතුරුමුහුණත අමාරු වෙන්නේ අපි කලින් ඉංග්‍රීසි අතුරුමුහණට හුරු වෙලා එයට මාරු වෙන නිසයි. අපි ඉංග්‍රීසි වචනයට අනුරූප තේරුම සිංහල අතුරුමුහුණතේ හොයන්න යන නිසයි. සිංහල අතුරුමුහුණත ම උපාංගය ගත්ත ගමන් දාගන්නව නම් ඔය ප්‍රශ්නේ නැහැ.

හැබැයි විහිලුවක් වෙන විදියෙ පාරිභාෂික වචන හැදිලිත් නැතිවම නෙවි. මේ ගැන කියද්දි මට අපූරු කථාවක් මතක් වුණා. මේක ඇවිල්ලා ටයිටස් තොටවත්තගේ අයියා - හෙල හවුලේ හිටපු ඊලියන් සිල්වා මහත්තය කරපු හෙල අවුලක් ගැන අතුල රන්සිරිලාල් මහත්තය ලක්බිමකට කියූ කතාවක්.

ටයි මහත්තය විද්‍යා වැඩසටහනක් වෙනුවෙන් ඉලෙක්ට්‍රෝන, ප්‍රොටෝන, නියුට්‍රෝන වලට සිංහල නම් හදවාගෙන එන්න කියා අතුල මහත්මයා ව යැව්වාලු ඊලියන් සිල්වා ළගට. ඊලියන් සිල්වා මහත්මයා අගනා සිංහල පාරිභාෂික වචන රැසක් නිර්මාණය කරපු හෙල හවුලේ වියතෙක් වගේ ම ඉංජිනේරුවරයෙක් ද වුණා. උපසිරැසි වැනි අද සමාජගත ව තිබෙන ඇතැම් අගනා පාරිභාෂික නම් තැනුවේ ඔහු. ඊලියන් සිල්වා මහතා උප-පරමාණුක අංශුවලට දමා තිවුණු නම් ටික මෙහෙමයි.

ඉලෙක්ට්‍රෝන - ඍණ රොන්
ප්‍රෝටෝන - ධන රොන්
නියුට්‍රෝන - නපු රොන්

මේක දැකපු ටයි මහත්තයා කෙනකුගෙන් ඇහුවලු ඉස්කෝලවලත් උගන්වන්නේ මේ වචනවලින් ම ද කියල. පිළිතුර ලැබුනලු නැහැ ඉංග්‍රීසියෙන් තියෙන වචන ම තමයි ඉස්කෝලේ උගන්වද්දි පාවිච්චි කරන්නේ කියලා. "අයියට ගිහින් එයාගේ රොන් ටික මල්වලට දමාගන්න කියන්න" කියපු ටයි මහත්තය ඉංග්‍රීසි වචන ම පාවිච්චි කරාලු. නමුත් ඇත්තට ම ඊලියන් සිල්වාගේ වචන වැරදි ම යි කියන්න බැහැ. ධනාරෝපිතබව, ඍණාරෝපිතබව, ආරෝපණ රහිත බව (නපුංසක කම) ඉස්මතු වෙන විදියට කුඩා අංශු බව හඳුන්වන්න රොන් කියන වචනෙත් යොදාගෙන එතුමා ලස්සනට වචනේ හදලා තියෙනවා. ඒත් විද්‍යා සන්දර්භය තුළ එය යෙදුණා ම එන නුහුරු-විකාර බව එතුමා සැලකිල්ලට ගත්තේ නැහැ. අදටත් මේ විදියේ වචන හදන අය ඉන්න පුලුවන්. හැබැයි බහුතරයක් පාරිභාෂික වචන ඉතා ම නිවැරදි ව තනා තිබෙනවා.

- සචින්ත මදූෂාන්